# සන්නිවේදන

## ශාස්ත්‍රීය සංග්‍රහය තෙවන වෙළුම 2013

40th
1973 2013 Anniversary
Department of Mass Communication
University of Kelaniya- Sri Lanka

ජනසන්නිවේදන අධ්‍යයන අංශයේ

**සිව් දශක සැමරුම් කලාපය**



සහකාර කථිකාචාර්ය අමාලි උත්පලා නන්දසිරි
*ජනසන්නිවේදන අධ්‍යයන අංශය,*
*කැලණිය විශ්වවිද්‍යාලය.*


# සද්ධර්ම රත්නාවලියෙන් නිරූපිත සන්නිවේදන ශක්‍යතා

## හැඳින්වීම

"සද්ධම්මට්ඨිති මිච්ඡන්තො - ධම්මසෙන යතිස්සරො
ආකාසි පවරං ඒතං - සද්ධම්ම රතනාවලිං"[1]

"සද්ධර්මයෙහි ස්ථිර පැවැත්මක් කැමති වන ධර්මසේන නායක ස්වාමීන්වහන්සේ මේ උතුම් සද්ධර්ම රත්නාවලිය ලියූ හ." යන්න ඉහත පාඨයේ අදහසයි. 'සදහම් නමැති රුවන් එකිනෙක අමුණන ලද රත්නාවලියක්' හෙවත් 'රුවන්වැලක්' යන අරුත සද්ධර්මරත්නාවලිය'යන්නෙන් හැඟවේ. දඹදෙණි සමයේ විසූ මහා වියතෙකු වන ධර්මසේන හිමියන්ගේ බෞද්ධ චින්තනයත්, ධර්මය හා භාෂා ඥානයත්, පොදුජන සමාජය ඇසුරින් පෝෂණය වූ ස්වකීය චිත්තයත් මෙම කෘතිය තුළින් ප්‍රකට කෙරේ. සද්ධර්ම රත්නාවලිය රචනා කිරීමේ බුද්ඝෝෂ හිමියන්ගේ 'පාලි ධම්මපදට්ඨ' කතාව ඇසුරු කර ගනී. ධම්මපදට්ඨ කථාව යනු ධම්මපදයේ වූ ගාථාවන්ට අර්ථ සපයන සේ රචනා කළ පාලි ග්‍රන්ථය කි. නමුත් සද්ධර්ම රත්නාවලිය යනු එහි අනුපිටපතක් නොවන බවත්, එය අහඹුවක් නොව කතුවරයා විසින් සපුරා ලූ ප්‍රයත්නයක ප්‍රතිඵලයක් බව පැහැදිලි ය.[2]ධම්මපදයත්, ධම්මපදට්ඨ කතාවත්, අනුරාධපුර යුගයේ සිට ම වියතුන්ගේ සම්භාවනාවට ලක් විය. ධම්ම පදයෙහි අන්තර්ගත බුදුදහමෙහි ගැඹුරු දාර්ශනික චින්තාව හා මානවයාගේ භෞතික මෙන්ම ආධ්‍යාත්මික දියුණුවට උර දෙන චර්යා පද්ධති පිළිබඳව කෙරෙන ඉගැන්වීම් හුදී ජන අවබෝධය උදෙසා ඉදිරිපත් කිරීමේ කාර්යය සද්ධර්ම රත්නාවලී කතුවරයා මනාව ඉටු කරන්නේ ය.සද්ධර්ම රත්නාවලිය ලිවීමේ උතුම් වූ පරමාර්ථයධර්මසේන හිමියෝ මෙසේ දක්වති.

"එසේ හෙයින් යම් කෙනෙක්, නුවණ මඳවත් කුසලච්ඡන්දය ඇතිව ධර්මාභියෝගයට උපදෙස් ලදින් බණ දැන පින්කමැ හැසිර නිවන් සාද ගනිත් නම් එසේ වූ සත් පුරුෂයන්ට වැඩ සඳහා සද්ධම් රත්නාවලිය නම් වූ ප්‍රබන්ධයක් කරම්හ."[3]

කෘතියේ අන්තර්ගතය පිරික්සීමේ දී, කතුවරයාගේ මෙම චින්තනය ඉතා පැහැදිලිව දක්නට ලැබේ.සිය අභිප්‍රාය ඉටු කර ගැනීම පිණිස සද්ධර්ම රත්නාවලි කතුවරයා විවිධ සන්නිවේදන ක්‍රමෝපායයන් උපයුක්ත කර ගනී. සාහිත්‍ය සන්නිවේදනයෙහි ලා සන්නිවේදන ශක්‍යතා වැදගත් වේ. සාහිත්‍ය නිර්මාණයක භාෂාව ඔස්සේ ගොඩනැගෙන ගද්‍ය රීතිය, අඛ්‍යාන ගොඩනැඟීම, භාෂා ප්‍රයෝග යන සියල්ල සන්නිවේදන ශක්‍යතා වශයෙන් ගැනේ. සන්නිවේදන ශක්‍යතාවේ මූලික ලක්ෂණ අතර, සැලසුම් සහගත ඉදිරිපත් කිරීම, නිර්මාණශීලීත්වය, සංස්කෘතික සබඳතා දැක්වීම, චින්තන ධාරිතාවන් පිළඹිඹු කිරීම හා අන්තර් සංස්කෘතික අවබෝධය ලබාදීම දැක්විය හැකි ය.

සහෘදයා ආනන්දයෙන් ප්‍රඥාව කරා ගෙනයාම සාහිත්‍ය නිර්මාණයකින් අභිමත මුඛ්‍ය අරමුණකි. මෙහිදී සාහිත්‍ය කෘතියක් ග්‍රාහකත්වයෙන් දුරස් නොවන පරිදි ඉදිරිපත් කළ යුතු ය. ඒ සඳහා නිර්මාණකරණයේදී ලේඛකයෝ විවිධ නිර්මාණශීලි ප්‍රතිපදාවන් අනුගමය කරති. සද්ධර්ම රත්නාවලියෙන් නිරූපිත ගද්‍ය රචනා ක්‍රමවේදය, එහි කථා ආකෘතිය හා කථා වින්‍යාසය, භාෂා ප්‍රයෝග මෙන් ම කථාංගවෙතින් දෘශ්‍යමාන වන අන්තර් සංස්කෘතික ලක්ෂණ යනාදි සන්නිවේදන ශක්‍යතා පිළිබඳ මෙහිදී අධ්‍යයනය කෙරේ.

## සද්ධර්ම රත්නාවලියේ ගද්‍ය රචනා ක්‍රමවේදය

සද්ධර්ම රත්නාවලිය රචනා කිරීමේ රීතිය සහ භාෂා ශෛලිය ගද්‍ය රචනා ක්‍රමවේදය යටතේ සාකච්ඡා කෙරෙයි. රීතිය යටතේ භාෂා රීතිය පිළිබඳව මූලිකව විමසා බැලේ.සද්ධර්ම රත්නාවලිය වූ කලී කර්තෘවරයාගේ ස්වතන්ත්‍ර නිර්මාණ නොවේ. එකී කෘති බිහිවීමෙහිලා උපස්ථම්භක වූ පාලි ධම්මපදට්ඨ කතාවයි. නමුත් සද්ධර්ම රත්නාවලිය රචනා කිරීමේදී ධම්මපදට්ඨ කතාව ගුරුකොට ගත්ත ද එය ධම්මපදට්ඨ කතාවේ පදානුගත පිටපතක් නොවන බව කතුවරයා ග්‍රන්ථාරම්භයේදීම සඳහන් කරයි.[4]ඒ අනුව සද්ධර්ම රත්නාවලිය රචනා වී ඇත්තේ ධර්මසේන හිමියන්ට අනන්‍ය වූ සිංහල ගද්‍ය රීතියකට අනුව ය. සද්ධර්ම රත්නාවලිය රචනා කිරීමේදී භාෂා රීතිය සැකසී ඇත්තේ කතුවරයා කෘතිය නිර්මාණය කිරීමේ මුඛ්‍ය පරමාර්ථය වෙනුවෙනි.

එමෙන් ම කතුවරයා ධම්මපදට්ඨ කතාවේ වූ කතා පුවත් සියල්ල සද්ධර්ම රත්නාවලිය රචනයට යොදා නොගනී. ස්වකීය ග්‍රන්ථ රචනා කිරීම් ප්‍රස්තුත අරමුණු අනුව ධම්මපදට්ඨ කතාවේ අත්හල යුතුතැන් අතහැර, එකතු කළ යුතු කාරණා එකතු කර ඇත. ඒ අනුව ධම්මපදට්ඨ කතාවේ පදානුගත විස්තර ඉදිරිපත් කිරීම බැහැර කරයි. එහිදී මිලින්ද ප්‍රශ්නය බැහැර කරයි. නමුත්, මිලින්ද ප්‍රශ්නයේ බාහිර කතා ඇසුරින් නාගසේන කතාව ඉදිරිපත් කර ඇත. දික්සඳ අටුවාව ඇසුරෙන් බරණැස් රජුගේ කතාව, සුත්ත නිපාත අටුවාව ඇසුරින් කාෂ්ඨවාහන රජුගේ කතාව හා සාතගිරි හේමවත දෙදෙනාගේ වස්තුව යොදා ගනියි. බුද්ධවංස පාලිය හා අටුවාව ඇසුරින් සූවිසිවිවරණය කතා හා බුද්ධචරිත දක්වයි. මංගල සූත්‍ර අටුවා ආදී වූ කතා ආදිය බැහැරින් ගෙන කෘතිය රචනා කිරීමට කතුවරයා පෙළඹී ඇත.

එසේම සද්ධර්ම රත්නාවලිය රචනා කිරීමෙන් ධර්මසේන හිමියෝ පළමුවරට කතාවස්තු ක්‍රමයක් සාහිත්‍යයට හඳුන්වා දී ඇත. එය මෙරට බණකතා සාහිත්‍යයේ නවතම හැරවුම් ලක්ෂයක් ලෙස පෙන්වාදිය හැකි ය. එකල ලියැවුණු බොහොමයක් කෘති මෙන් ම සද්ධර්ම රත්නාවලියට ප්‍රස්තුත වන්නේ 'බුද්ධ චරිතය' යි. එහෙයින් කතා තේමාව අතින් ග්‍රාහකයාට නව මුහුණුවරක් නොදක්වුව ද, නවතාවක් එකතු කිරීමට සමත් වූයේ ගද්‍ය රචනා කිරීම විෂයෙහි භාවිත කළ භාෂා රීතිය මඟිනි. ඒ බව මාර්ටින් වික්‍රමසිංහයෝ මෙසේ දක්වති.

''සිංහල ගද්‍ය, ඊට වස්තු වුණු බුද්ධ චරිත කථා නිසා පාඨකයන් වෙහෙසන තරම් සමාන ස්වරූප ඇති ග්‍රන්ථාවලියක් වී ය. මේ එක මුහුණුවර නැති කොට සිංහල ගද්‍යයට අලුත් ස්වරූපයක් දීමට බොහෝවිට සිංහල ග්‍රන්ථකාරයන්ට වඩාත් වහල් වූයේ ඔවුන්ගේ භාෂා රීතිය යි.''[5]

සද්ධර්ම රත්නාවලියේ භාෂා ශෛලිය යටතේ කතා කලාවේ රිද්මය පිළිබඳව විමසා බැලේ.සද්ධර්ම රත්නාවලිය රචනා කිරීම සඳහා භාවිත වියරණ රීතියට අනුව සැකසුණ ගද්‍ය භාෂා ශෛලියේ සුවිශේෂිතාවක් දැකගත හැකි ය. ඒ සද්ධර්ම රත්නාවලියේ භාෂා ශෛලිය වන්නේ 'බණකතා' ශෛලියයි.කතුවරයා පාලි ග්‍රන්ථයක් ඇසුරු කරගත්ත ද ස්වතන්ත්‍ර ගද්‍ය රීතියක් මෙන් ම ඊට උචිත ගද්‍ය ශෛලියක් අනුගමනය කර ඇත. එහිදීනුවණ මඳ වුව ත්, කුසල් කිරීම සඳහා කැමැත්ත ඇති පුද්ගලයන්ට බණ දැනගැනීම සඳහා කෘතිය කර ඇති බවසද්ධර්ම රත්නාවලී කතුවරයා දක්වයි. බණ දැනගැනීමට නම්, ධර්මයෙහි පිළිබඳ දන්නා අයෙකු මඟින් අසා දත යුතු ය. එසේ නොමැතිව, සාක්ෂරතාවයෙන් මඳ පුද්ගලයින්ට සද්ධර්ම රත්නාවලිය කියවා තේරුම් ගැනීමට නොහැකි ය. එබැවින් අසා අවබෝධ කරගැනීම සඳහා 'ශ්‍රාවක' ජනතාවක් සඳහා සද්ධර්ම රත්නාවලිය ලියැවී ඇති බව පෙනී යයි.

''කෘතාධිකාර මහ පිනැති කෙනෙකුන්ට මුත් විදුරු පර්වත විදින්ට කුහුඹුවන්ට බැරියා සේ, සියලු ලෙසින් ම කෘත පුණ්‍යතා නැතිව ජාත්‍යන්ධයන්ට අන්ධ යෂ්ටිය නැතිව ගමන් බැරියා සේ, ලක්ෂණ දත ලක්ෂණානුසාරයෙන් ඉගෙන දැනගැන්ම නුවණ මඳවුන්ට බැරි ය.

එසේ හෙයින් යම් කෙනෙක්, නුවණ මඳවත් කුසලච්ඡන්දය ඇතිව ධර්මාභියෝගයට උපදෙස් ලදින් බණ දහ පින්කමැ හැසිර නිවන් සාද ගනිත් නම් එසේ වූ සත් පුරුෂයන්ට වැඩ සඳහා සද්ධර්ම රත්නාවලිය නම් වූ ප්‍රබන්ධයක් කරම් හ."[6]

'බුද්ධ චරිතය' මුල් කර ගෙන ලියැවුණු අන්තර්ගතයට හා ඊට අදාළබණ කතා ශෛලියට දඹදෙණි යුගයේ පැවති ඉඩකඩ පිළිබඳ මාර්ටින් වික්‍රමසිංහයෝ මෙසේ පෙන්වාදෙති.

"අතීතයෙහි සිංහල ගද්‍ය ග්‍රන්ථ, ධර්මදේශකයන්ගේ තැන්ගත් බැවින් එවැනි දෝෂ දර්ශනයකට භාජනය නොවී ය. එක මුහුණුවර ඇති ඒ කථාවස්තු, ධර්මය උගැන්මට නැමුණු සිත් ඇතියන්ගේ සිත් වෙහෙස නොකළේ ය. පැරණි ගද්‍යයක් අනිකකු කියවනු අසන්නකුට තමාම කියවා රසාස්වාදයට වැර වෑයම් කරන එකකුට මෙන් වෙහෙසක් නොදුනේ. කියවන්නවුන්ගේ කටහඬ, ඇදීම-පෑදීම යන ආදිය ඔවුනොවුන්ගේ ගතිගුණ හා පුරුදු ද අනුව වෙනස්වන බැවින් අසන්නාට එකම කථාවස්තුව නවතාවයෙන් කිහිපවරක් අසන්නට ලැබේ."[7]

මේ අනුව සද්ධර්ම රත්නාවලිය කෘතිය ද පාඨකයෙකු නොව ශ්‍රාවකයෙකු සඳහා කරවූ බව පෙනී යයි.භාෂාත්මක රීතිය කෙරෙහි කතුවර ධර්මසේන හිමියන් සතු වූ භාෂා ඥානයත්,උන්වහන්සේ ජීවත් වූ සමාජ පරිසරය වෙතින් ලද ආභාසයත්, කෘතිය කරවීමේ අරමුණු අනුවත් ගද්‍ය භාෂා ශෛලිය වෙනස් මඟක යොමු කරවීය. එහිදී අන්තර්ගත සැකැස්ම ඉදිරිපත් කර ඇත්තේ බෞද්ධ චින්තනයට අනුව ය. එනම්, පොදු ජනතාවගේ ලෞකික ජීවිතයේ අභිවෘද්ධිය මෙන් ම අවසානයේ ලෝකෝත්තර සුවය වශයෙන් නිර්වාණය අවබෝධය සඳහා මාර්ගෝපදේශනය සැපයීමේ මුඛ්‍ය පරමාර්ථයෙනි.

සමාජය යහපත්ව පවත්වාගැනීම සඳහා බහුවිධ සන්නිවේදන අරමුණු සපුරාගැනීම විෂයෙහි මෙම කෘතිය රචනා වී ඇත.තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව ඇතිකරවීම, කුසලය අකුසලයෙහි ආදීනව පෙන්වාදීම, උපේක්ෂා සහගතව ජීවත්වීමේ වැදගත්කම දක්වීම, ආර්ය මාර්ගයට පිවිසීමේ මූලික පදනම වන දන, ශීල, භාවනාවේ නිරතවීමට වීර්යය, අධිෂ්ඨානය ඇතිකරලීම, චතුරාර්ය සත්‍ය අවබෝධ කරගැනීමට අවශ්‍ය පෙළඹවීම, සමබර ජීවන පැවැත්මට අවශ්‍ය උපදේශන සැපයීම, සද්ධර්ම රත්නාවලියේ මුඛ්‍ය අරමුණු අතර වේ. ඒ සඳහා යොදාගත් ප්‍රකාශන ස්වරූපය බණකතා ශෛලිය යි.

වියත් නොවූ සාක්ෂරතාවයෙන් මඳ, එහෙත් ධර්මය අවබෝධ කරගැනීම හා කුසල් වැඩීමේ උත්සාහය ඇති, ගැමි ජනතාව වෙනුවෙන් රචිත මෙම කෘතියේ ප්‍රකාශන රීතිය නිර්මාණශීලී වූවකි. ඒ සඳහා ශ්‍රව්‍යගෝචර ඉදිරිපත් කිරීමක රඳවා තබාගැනීමට 'තව ද,, කෙසේ ද යත්,, එහෙයින්,,' යන පද භාවිත කරමින් ස්වකීය කතා කලාව එකිනෙක සම්බන්ධ කර ඇත.

ඒ අනුව කෘතියෙහි ඉදිරිපත් කරන කතා වස්තුන් සියල්ල අවසානයේ කතුවරයාගේ ප්‍රධාන අරමුණ හා සබැඳේ. එය නූතන සන්නිවේදනයේ යම් අරමුණු කිහිපයක් සපුරාගැනීම ගැනීමට සංදේශය සකස් කරන්නාක් බඳු ය. තොරතුරු සම්පාදනය, දැනුම, විනෝදාස්වාදය, රසවින්දනය හා සමකාලීන සමාජ අවශ්‍යතා සඳහා පොළඹවාලීම යන්න සන්නිවේදනයේ මුඛ්‍ය අරමුණු අතර වේ. නූතනයේ හඳුනා ගැනෙන සන්නිවේදන මූලධර්ම තම කෘතිය රචනා කිරීමේ දී යොදාගැනීමෙන් කතුවරයා තුළ වූ සමාජ පරිඥානය විශද වේ.සෑම කතාවස්තුවක් අවසානයේ දී ම කතුවරයා සිය ප්‍රධාන අරමුණ සමඟ බද්ධ වන සෙසු සාධක සියුම් ලෙස විවරණය කරයි. ඉන් සමහරක් සංක්ෂිප්තව මෙසේ දක්විය හැකි ය.

i. මඳ නුවණක් ඇත්තවුන්ටත් නුවණැති සියලු දෙනාටම කුසල් කිරීමට ආශාව ඇතිකර නිවන් සාදා ගැනීමට මාර්ගෝපදේශනය සැපයීම.

ii. අකුසල් හැරදා කුසල් රැස්කර කුසලයෙහි හැසිරීමට අවශ්‍ය සිත් පිරිසිදු කිරීමට මඟ පෙන්වීම.

iii. සත්පුරුෂයන් විසින් තම ශක්ති ප්‍රමාණයේ පින්දම් කර දෙව් මිනිස් ලෝකවල පහළවීමට ඉපදීමට මඟ පෙන්වීම.

iv. සැදැහැතියන් විසින් අන් අය කුමක් කළ කීව ද සියල්ල මෙත් සිතින් ඉවසමින් දුසිරිතින් මිදී සුසරිතේ හැසිරවීමට මඟ පෙන්වීම.

v. නුවණ මද වූවන් විසින් බණකතා දහම් සකස් කොට ඉගෙන ගත් ධර්මය පිළිපැද නිවන් අවබෝධයට මඟ පෙන්වීම.

vi. තෘෂ්ණාදි කෙලෙසුන් නැතිකර කුසල් දහම් වර්ධනය කර මෙලොවත් සතු වී පරලොව සුගතිගාමී වීමට මඟ පෙන්වීම.

මේ අනුව සද්ධර්ම රත්නාවලිය තුළ වස්තු විෂය කරගත්තේ, 'බුද්ධචරිතය හා බැඳුණු ආගමික චින්තනය' යි.කතුවරයාගේ ආස්ථානගත චින්තනයේ මුල්තැන හිමිවන්නේ 'බුදුරජාණන්වහන්සේට' ය.සද්ධර්ම රත්නාවලිය බුදු රජාණන් වහන්සේ වදාළ දහම් කරුණු ඉදිරිපත් කරමින්ප්‍රඥා මාර්ගයේරචනා වී ඇත.එහි අවසාන අරමුණ වන්නේ ලෞකික ජීවිතයේ අරමුණු සාර්ථක කරගැනීම හා කෙළවර 'නිර්වාණ මාර්ගයෙහි ජනතාව ගමන් කරවීම' යි. ඒ සඳහා කතුවරයා බස හැසිරවීමේ රීතිය සහ ශෛලිය මැනවින් උපයෝගී කර ගෙන තිබේ.

## සද්ධර්ම රත්නාවලියේ කතා ආකෘතිය

සද්ධර්ම රත්නාවලියෙහි ගද්‍ය වින්‍යාසය කතුවරයාගේ අරමුණට උචිත පරිදිපෙළගස්වා ඇත. කතා වින්‍යාසය සැකසෙන්නේ එකී ආකෘතිය අනුවය. මෙහි එක් එක් කතා වස්තූන් විමර්ශනය කිරීමේ දී එහි ආකෘතික ස්වභාවය වටහාගත හැකි ය. ඒ අනුව මුල, මැද, අග ආදිය මනාව ගළපන ලද ලේඛන ආකෘතියකින් සද්ධර්ම රත්නාවලිය සමන්විත ය. කථා වස්තු රචනයේදී කතුවරයා මෙම ආකෘතිය වඩාත් හොඳින් සිය ලේඛනයට භාවිත කරයි.

කතා සන්දර්භයෙහි අවස්ථා නිරූපණය, සිදුවීම් පෙළගැස්වීම ද ක්‍රමානුකූල ය. කතුවරයා ගද්‍ය ආකෘතිය ක්‍රමානුකූලව සැකසීම මඟින් සිය කතා වස්තුව ඉදිරිපත් කිරීමේ අරමුණ උපක්‍රමශීලීව ජයගෙන ඇත. එහිදී ශ්‍රාවකයාට කතාව කෙරෙන් මොහොතකට හෝ දුරස් විය නොහැකි අන්දමින් සියුම්ව කතා එකිනෙක යා වන ලෙස රචනා කර ඇත. ඒ අනුව කතාව කෙරෙහි ශ්‍රාවකයා ඇද බැඳ තබාගනිමින් කතාවස්තුව නිශ්චිත අවසානයක් කරා රැගෙනයාමට කතුවරයා උත්සහ ගනියි.සද්ධර්ම රත්නාවලියෙහි සඳහන් කතා ආකෘතියවෙතින් දෘශ්‍යමාන වන සුවිශේෂිතා පහත පරිදි දැක්විය හැකි ය.

i. වර්තමාන කතාව සමඟ බැඳුණු අතීත කතාවකින් යුක්ත වීම.

ii. ඇතැම් කතාවන්හි සන්දර්භය විමසීමේ දී අතීත පුවත් නොතකා වර්තමාන කතාව පමණක් ඉදිරිපත් කරමින් කතාවස්තුව ඉදිරිපත් කරයි.

iii. කතා වස්තුව ආරම්භ කිරීමට පෙර, එය ඉදිරිපත් කිරීමේ අරමුණු කතා ආරම්භයේ දී දැක්වීම.

iv. කතා වස්තුවෙන් උගත යුතු දහම් කරුණු කතාව අවසානයේ දී ඉදිරිපත් කිරීම.

v. ගැඹුරු දහම් කරුණු ඉදිරිපත් කිරීමේදී කතා වස්තුව මධ්‍යයේ ධර්ම කරුණු පැහැදිලි කිරීමෙහි ලා පාලි ගාථාවක් දැක්වීම.

නිදසුන් වශයෙන් සද්ධර්ම රත්නාවලියේ එන බණ කතාවන්හි අන්තර්ගතය තුළ දැකගත හැකි කතා ආකෘතික ලක්ෂණ මූලික කරුණු හතක් යටතේ පෙන්වාදිය හැකි ය.

i. කතාවස්තුව දැක්වීමට හේතුව
ii. වර්තමාන කථාව
iii. අතීත කථාව
iv. ගාථා
v. දහම් කරුණු විස්තර කිරීම
vi. සමෝධානය
viii. ආදර්ශය

කතුවරයා කතාවස්තුව ඉදිරිපත් අරඹන්නේ එය ඉදිරිපත් කිරීමේ හේතුව සංක්ෂිප්තව දක්වමිනි. පසුව වර්තමාන කතාව බුදුහිමි වැඩසිටි යුගයේ සිදු වූ සජීවී සිදුවීමක් ලෙස ඉදිරිපත් කරයි. අතීත කතාව, වර්තමාන සිදුවීමට අදාළව චරිත, සිද්ධි, අවස්ථාව අතීත ජන සමාජයේ තුළින් මතුකර පෙන්වයි. එහිදී කතාපුවතට අදාළ ධර්ම කරුණු සංක්ෂිප්තව විග්‍රහ කරයි. කතා වස්තුව අවසාන

වන්නේ ඊට අදාළ වූ අතීත, වර්තමාන කතාවල චරිත, සිද්ධි, අවස්ථා ගළපාලමින් ඊට අදාල උපදේශනය, අනුශාසනාව ද සිදු කරමිනි. මෙහිදී අතීත කතාව හා වර්තමාන කතාව සමෝධානය කර ඉදිරිපත් කිරීමට උදාහරණ ලෙස,

- චක්ඛුපාල තෙරුන්වහන්සේගේ කතාවස්තුව
- කාලියකින්නගේ කථාව
- සාමාවතී මරණ පරිදීපන කතා
- චිත්ත හත්ථ තෙරුන්වහන්සේගේ කතාවස්තුව
- කුක්කුට මිත්තයන්ගේ වස්තුව
- සුන්දර සමුද්ද තෙරුන්වහන්සේගේ වත

යන කතාවස්තු නිදසුන් ලෙස දැක්විය හැකි ය.

**නිදසුන 01:**

කතාවස්තුව : චක්ඛුපාල තෙරුන්වහන්සේගේ කතාව

පැවසීමේ අරමුණ: අකුසල කිරීමේ කර්ම විපාක

වර්තමාන කතාව: ගෞතම බුදුහිමි දවස චක්ඛුපාල තෙරුන් රහත් වීමට පින් කළ ද ඇස් අන්ධ වීම.

අතීත කතාව: පෙරභවයක දී අක්ෂි වෛද්‍යවරයෙකු උපන් චක්ඛුපාල තෙරුන් තමනට වංචා කළ ගැහැණියකගේ ඇස් අන්ධ කරවීම.

පාලි ගාථාව : සන්ධිමෙකන්තු කම්මෙකං - ජනෙති න තතො පරං
අනෙකානි විපාකානි - සඤ්ජනෙති පවත්තියං

දහම් කාරණය: අකුසල කර්මය ගොනා පසුපස බැඳ එන කරත්තය මෙන් පසුපස පැමිණෙන බව දැක්වීම.

සමෝධානය: එකල වෛද්‍යවරයා නම් චක්ඛුපාල තෙරුන් වීම

ආදර්ශය: දුෂ්චරිතයෙන් මිදී පිරිසිදු අදහස් ඇතිව කුසල් සිත් ඇති කරගැනීම.

**නිදසුන 02 :**

කතාවස්තුව: චිත්ත හත්ථ තෙරුන් වහන්සේගේ කතාවස්තුව

පැවසීමේ අරමුණ: විචාරශීලි නොවීම ප්‍රඥාවට හා ධර්මාවබෝධයට බාධාවක් බව දැක්වීම.

වර්තමාන කතාව: චිත්තහත්ථ තෙරුන්ට රහත්වීමට පින් තිබුණ ද සයවසක් මහණව සිට සිවුරු හැරීමට හේතුව විමසීම.

අතීත කතාව: පෙරදවස කුද්දාල නමින් ගැමියෙකුව ඉපිද බීජ හා උදලු තලයක් පිළිබඳ තෘෂ්ණාවෙන් මහණව නැවත උපැවිදි වීම.

පාලි ගාථාව: යෙන දෙවූපපත්‍යස්ස - ගන්ධබ්බො වා විහිඞ්ගමො
යක්ඛත්තං යෙන ගච්ඡෙය්‍යං - මනුස්සත්තඤ්ච අබ්බජෙ,
තෙ මය්හං ආසවා ඛීණා - විද්ධස්තා විනළීකතා

දහම් කාරණය: රාග, ද්වේෂ හා මෝහ ආදි අකුසල චෛතසිකයන්ගේ විපාක නොදැන ගමන් කරන්නාට සසර බොහෝ දුක් සහිත වූවකි. සිත දමනය කරගත් තැනැත්තාට සසර ගමන කෙටි බව දැක්වීම.

සමෝධානය: අතීතයේ කුද්දාල නම් ගැමියා මෙකල බුදුහිමි ය.

ආදර්ශය: කෙලෙස් ඇතිවන ක්‍රියාවන්ගෙන් මිදී කුසල් චේතනාවෙන් ධර්මය අවබෝධ කරගැනීමට උත්සහ දැරීම.

කතුවරයා ඉහත අංගසහිතව කතාව ඉදිරිපත් කරන අතර ඇතැම් විටෙක මෙම අංග අඩු වැඩි වශයෙන් යොදා ගැනේ. බොහොමයක් කතා වර්තමාන කතාව හා බැඳුණු අතීත කතාවකින් යුක්ත වේ. ඇතැම් කතාවන්හි සන්දර්භය විමසීමේ දී අතීත කතාපුවත් නොතකා වර්තමාන කතාව පමණක් දක්වයි.මෙහිදී වර්තමාන කතාව ඉදිරිපත් කිරීමේදී ද කතුවරයා ආකෘතියක් භාවිතකර ඇත. එකී ආකෘතිය ඔස්සේ,

i. අරමුණ

ii. වර්තමාන කතාව

iii. උපදේශය

යන තේමා දක්වා ඇත. ඇතැම් අවස්ථාවන්හී දී පාලි ගාථාවක් ද භාවිතකර ඇත. වර්තමාන කතාව පමණක් දැක්වීමේදී කතුවරයා නිර්මාණශීලි භාෂා ප්‍රයෝග ආකෘතිය තුළ යොදගැනේ. නිදසුන් වශයෙන් භාගිනෙය්‍ය රක්ඛිත තෙරුන් වහන්සේගේ කතා වස්තුව, භාගිනෙය්‍ය තෙරුන්ගේ සිතුවිලි මගින් ඉදිරිපත් කිරීම දැක්විය හැකි ය. නිර්මාණශීලි ක්‍රමවේද ඔස්සේ වර්තමාන කතාව පමණක් ඉදිරිපත් කරන කතාවස්තු කිහිපයක් නිදසුන් වශයෙන් දැක්විය හැකි ය.

- සොරෙය්‍ය වස්තුව
- මච්චරීයකෝසිය සිටාණන්ගේ කතාවස්තුව
- කුණ්ඩලකේශී කතා වස්තුව
- කොසඹෑ නුවර වහන්දෑගේ කථාව
- භාගිනෙය්‍යිය සංරක්ඛිත තෙරුන් වහන්සේගේ වස්තුව
- සෝෂක සිටාණන්ගේ වස්තුව
- කුම්භඝෝෂක වස්තුව
- මට්ටකුණ්ඩලී කතා වස්තුව
- පටාචාරා වස්තුව
- කිසාගෝතමී කතාවස්තු

**නිදසුන 01**

කතාවස්තුවඃ සොරෙය්‍ය කතා වස්තුව

අරමුණඃ සිතින් සිතන පමණින් අකුසල් ඇතිවන බව දැක්වීම

වර්තමාන කතාවඃ සෝරෙය්‍ය සිටු පුත්‍රයා රහත් වහන්සේ කෙනෙකුන් පිළිබඳ රාග සිතක් පහළ කරගැනීම නිසා පුරුෂභාවය නැති වී ගොස් ස්ත්‍රියක් බවට පත් වීම.

උපදේශයඃ සිත හික්මවාගෙන කුසල් වැඩෙන සිතුවිලි දැරීමට උත්සහ කළ යුතු ය.

**නිදසුන 02**

කතාවස්තුවඃ මච්ඡරීය කෝසිය සිටාණන්ගේ වස්තුව

අරමුණඃ මසුරුසිත ඇතිවීම කුසල් කිරීමේ ප්‍රමාද වීම විෂයෙහි බලපාන බව දැක්වීම

වර්තමාන කතාවඃ මච්ඡරීය කෝසිය සිටාණන් රස තෘෂ්ණාවෙන් මසුරු සිත් ඇතිව කටයුතු කිරීම.

උපදේශයඃ මසුරු සිත් නැති කොට කුසල් සිදුකර නිර්වාණය පිණිස උත්සහ කළ යුතු ය.

**සද්ධර්ම රත්නාවලියේ භාෂා භාවිතය**

සාහිත්‍ය නිර්මාණයක සාර්ථකත්වයෙහිලා නිර්මාණකරුවා උපයුක්ත කරගනු ලබන රචනා ක්‍රමවේද මෙන් ම ඉන් මතුකරන්නා වූ අදහස් වැදගත් වේ. සාහිත්‍ය සන්නිවේදනයේ සැලසුම් සහගත බව, නිර්මාණශීලීත්වය, චින්තන හැකියා ගොඩනැංවීම, සංස්කෘතික සබඳතා ගොඩනැගීම හා අන්තර් සංස්කෘතික ලක්ෂණ යන සන්නිවේදන ශක්‍යතා ලක්ෂණ භාෂාව මගින් ඉදිරිපත් කළ හැකි ය.

භාෂා භාවිතය හා ඒ පිළිබඳ කතුවරයා දක්න ප්‍රතිභාව මඟින් නිර්මාණශීලිව සාහිත්‍ය කෘතියේ අරමුණ කරා ළඟාවීමට කතුවරයාට හැකියාව ලැබේ. එකී නිර්මාණශීලි ප්‍රවේශයන් හා භාෂා උපක්‍රම සද්ධර්ම රත්නාවලි කතුවරයා හසු කරගෙන ඇත්තේ සමකාලීන සමාජය තුළිනි.

සද්ධර්මරත්නාවලිකතුවරයාසිය රචනා ශෛලිය තුළ විවිධ භාෂා ප්‍රයෝග බහුලව භාවිතකර ඇත.ගැමි විඥ්ඤාණයේ ස්වභාවය හඳුනාගත් කතුවරයා සිය කෘතියේ අන්තර්ගත එහි පිරුළු, ජනශ්‍රැතිකාංග, ජනවහර යනාදියෙන්සුලභව භාෂාව පෝෂණය කර ඇත.

**ගැමි වහර භාවිතය**

- "එක් අතකින් බොටුව අල්වාගෙන
- ඌම පතා බතුත් නොකා
- නුවණ නම් ඇතිවත්නා පළහා ගෙන කන්ට නොව
- සිරගෙයක ලූවා සේ ලූ හ.
- ඌ තුමූ බා ගොසින්
- පිටිකණ හයා බැඳගෙන"

ගැමි ව්‍යවහාරයට සමීප වූ ස්ථානෝචිත යෙදුම් මඟින් කතා ශෛලීන් නවතාවයෙන් පොදු ජනතාවට සමීප කර ඇත. කතුවරයා සමකාලීන භාෂා ඥානය පමණක් නොව ග්‍රාහක රුචිකත්වය අවබෝධ කරගනිමින් කතා වස්තුවේ අන්තර්ගතය සැකසයි.ගැමියන් අතර භාවිත වන, උන්දැ, මුන්දැ, දුරබැර, හැවිල්ල, පාන්කඩය, බාන, ගිනිපෙනෙල්ල, වේල, කබල, කුඩා සිගිත්ත, දරු පැටවු ආදී වචන ද කතුවරයා භාවිත කරයි.

ගැමි වහරේ පවතින යුගල පද, ගැමියන් අතර ඉතාමත් ප්‍රියකරන ජනප්‍රිය භාෂාවක් ලෙස දැක්විය හැකි ය. නිරුත්සාකව ගලා එන එවැනි වචන ගැමි ව්‍යවහාරයේ පවතියි. එවැනි යෙදුම් රාශියක් ද සද්ධර්ම රත්නාවලිය තුළ දකගත හැකි ය.

- කරන කියන දෙයක්..
- ගසෙක් කොළෙක් ඇත්නම්..
- වදනා පොවන අවස්ථාව..
- මහණ ගොයම්හු ඉදිරියෙහි අකට විකට දක්වම්හයි කීය..
- යම් කෙනෙකුන් මළ කළ දඩෙක් මුඩෙක් ඇත්නම්..
- මැරීම් තැලීම් ආදිය කටයුතු නෙවෙයි..

ජනවහරෙන් ගත් උපමා භාවිතය ද සද්ධර්ම රත්නාවලිය තුළ සුලභව දකගත හැකි ය.

- "තනා මැටියෙන් ගොමින් පිරියම් කට නොහැක්කා සේ..
- සියල් සිරුර වේයන් කෑ පරඬැල් පතක් මෙන්,"
- ඇස් සරහන්ට තොල අඳුන් ගාන්නා සේ,
- හූරු තුඩ සී වැල් තැබුවා සේ..
- "සායෙහි ලද බතක් බොහෝදෙනා බල බලා සිටිද්දී කන්නා සේ..
- පහන් කඳ පාමුල අඳුර නොනැසෙන්නා සේ,"
- කැට කොතැනක වැදුණත් පයක්ම ඔසවාගෙන දුවන බල්ලෙකු සේ..
- මී අබවලින් දුනුකේ ගස් නැගෙන්නා සේ..
- "පොල් ගසින් තල් පක් පතන්නා සේ..
- ගින්නෙන් සිහිල පතන්නා සේ.."
- අධොමුඛ නැකතකින් ශාස්ත්‍ර පටන් ගත්තා සේ..

- ආස්ථානයෙහි ඇති ලෙඩක් අනුන්ට කියන්න මැළිවන්නා සේ..

- දියෙහි අටගන්නා උත්පල කුමුදු දී වූ පුෂ්ප ජාතිහු මඩ හා දිය හේතු කොටගෙන උපදීද් ද..

- කමල පත්‍රගත ජල බින්දුවක් සේ කිසිවෙක ඇල්මක් නැති හෙයින්..

සද්ධර්ම රත්නාවලියේ වාක්‍ය ශෛලිය සැකසී ඇත්තේ කතාවේ සමස්තය මතුකොට දක්වෙන පරිදි ශ්‍රැති රම්‍ය විලාසයකිනි. මෙහි භාෂාව කෙටි වාක්‍ය රටා භාවිතයට නැඹුරුවී ඇත. මේ සඳහා නිදසුනක් ලෙස, පටාචාරා වහන්දෑගේ වස්තුව දක්විය හැකිය.පටාචාරාව දරු ප්‍රසූතියට මුහුණදුන් අවස්ථාවේ වූ දුක, වේදනාව, සංවේගය, ශෝකය ඉස්මතු කර දක්වීමට කතුවරයා ගත් උත්සාහය පහත පරිදි දැක්වීමට පිළිවන.

"ආස ගුගුරන්නා සේ හඬ ගසන්වත් වන. වස්නා වැසි බෝවා සේම ප්‍රසව දුකුත් බෝ වී ය. සමුණන් බණවාලා විලිත් පහරන්ට වන,," -පටාචාරාවන්ගේ වත-

**ශ්‍රැති රම්‍ය භාෂාව**

සාහිත්‍ය කියවීම අකුරු දත් පිරිසට සීමා වූ යුගයක, කියවීමේ නුවණ මඳ වුව ද රසවිඳීමට හැකි ශ්‍රැතිගෝචර වින්දන රටාවකට හුරු ශ්‍රාවකයා උදෙසා සද්ධර්ම රත්නාවලිය රචනා කර ඇත. අසා සිටින්නන් සඳහා ශබ්ද නඟා කියවීමට හැකි ශබ්ද රසයට ප්‍රමුඛත්වයක් දුන් රචනා ක්‍රමයක් මෙහිදී භාවිත කර ඇත. ඒ අනුව, සද්ධර්ම රත්නාවලියේ බස බෙහෙවින් ශ්‍රැති රම්‍ය වූවකි. ධර්මයෙන් කතා කීමට තරම් සුමධුර හා භාවික ගුණයෙන් භාෂා ප්‍රයෝග ඉදිරිපත් කර ඇත.කතුවරයා සද්ධර්ම රත්නාවලියේ භාෂා විලාසය ශබ්ද අලංකාර රසයෙන් අනූන කරනුයේ එහි අර්ථාලංකාරය නොනැසෙන පරිද්දෙනි. ඊට නිදසුන් පහත පරිදි දැක්විය හැකි ය.

- "සිත කණ වුවත් ඇස් නොකණ හෙයින්..
- ඇස ඇඳිරිය නැතත් කර්ම ඇඳිරිය බලවත් සේ.."
- "මස් බොල්වනු නිසාත් පව් බොල්වන නිසාත් සිවුරුස් මුගුරකින් තලා මස් බොල් වූ නියාව මුත් පව් බොල් වූ නියාව නොදන..
- අවීචියෙහි දී තමාගේ කටත් දල්වන ලෙසට ඌගේ කටත් දල්වා.."
- "සසරට පිටුපානා පමණක් මුත් බුදුබවට මුහුණලා.."
- "ශරීර පුෂ්ටිය නැතත් චිත්ත පුෂ්ටිය ඇතිව ගුණ පුෂ්ටිය එවාගත යුතු.."
- "සම්පත් මහත් වුවත් අදහස කුඩා හෙයින්..
- "වස්තුව ප්‍රබල වුවත් සිත දුර්වල හෙයින්.."
- "සිත වයිරි නැතත් ඇඟ වයිරි දක,"

**අනුප්‍රාසය මිශ්‍ර බස් වහර**

අර්ථ රසවැඩි වීම විෂයෙහි අනුප්‍රාස වැදගත් වේ. අනුප්‍රාසය හේතුවෙන් භාෂාවේ ශ්‍රැති රම්‍ය විලාසය ඉස්මතු වී පෙනේ.

i. "නො හැඟවීමෙන් කල් යත් යත් කසා සූර වත්කොට පීසූ කබලුවූ සේ පඬුවන් පැහැ ඇති විය.."

ii. "බිලයම් පිට ලා ලා තොල මෙතැනට ගෙනෙන පිණිස යි කිවූ ය...

iii. හෙතෙම කඩ කඩව ගලින් හී මිය තෙමේ ම බිලිවිය..."

iv. පසුව මුං සාව, පසුව මෑ සාව, පසුව බෙල් සාව, ලා පැසී......

සද්ධර්ම රත්නාවලිය ශ්‍රැති ගෝචර ශෛලියකින් රචිත දහම් කතා මාලාවක් වුව ද එය ව්‍යවහාර භාෂා රීතියට පමණක් අනුකූලව රචනා කර නොමැත. ව්‍යාකරණානුකූල යැයි සැලකෙන ලිඛිත ව්‍යවහාරය ද මනා සේ මුසු කරමින් කතුවරයා කෘතියේ ශ්‍රැති ගෝචර භාෂා රටාවක් උපදවා ඇත.

**සංක්ෂිප්ත භාෂා ලක්ෂණ**

සද්ධර්ම රත්නාවලි කතුවරයා සංක්ෂිප්ත වාක්‍ය භාවිතයට ගනී. එසේම එම වාක්‍ය ආකාර කිහිපයකින් ඉදිරිපත් කරයි. එනම්,

i. වාර්තාමය අයුරින් ඉදිරිපත් කිරීම.

**නිදසුන:** කුණ්ඩලකේසීගේ වස්තුව

"සිටුදුවණියෝ එවක් පටන් ඕ හට බත්, මාළු පිසති. කවති. පොවති. ඉස සෝධවති. නාවති,,."

ii. දේශීය භාෂා රටාවට නැකම් කියන සරල කෙටි වැකි භාවිතය

**නිදසුන:** පටාචාරා වහන්දැගේ වස්තුව

"සැවැත් නුවර සතළිස් කෙළක් විතර වස්තු ඇති සිටාණ කෙනෙකුන්ගේ දූවණි කෙනෙක් ඇත. මනහර රූ ධරති....."

iii. යම් කාලයක් තුළ සිදුවූ සිදුවීම කිහිපයක් සංක්ෂිප්තව දැක්වීම.

**නිදසුන:** කිසාගෝතමී වහන්දැගේ වස්තුව

"සරණ ආ නොබෝ කලෙකින් උන් බඩ අල්පායුක්ෂක දරු කෙනෙක් පිහිටා දසමස් ආයාමෙන් දවස්ගත ආ කෙනෙකුන් මෙන් පුතණු කෙනෙක් උපන් හ. ඌ පියවර ඔසවා ඇවිදිනා අවධියේ මළෝ ය..... "

**තත්කාලීන භාෂා ලක්ෂණ**

සද්ධර්ම රත්නාවලිය රචනා කිරීම සඳහා භාවිත භාෂා රීතිය ජනවහර, වියත් වහර, දහම් වහර, පාලි සංස්කෘත වහර ආදී මිශ්‍ර භාෂා ශෛලියක් භාවිතකර ඇත. හෙළ භාෂාවන්ට අමතරව පාලි, සංස්කෘත හා දමිළ වචන භාවිත කරමින් කෘතිය රචනා කළ ද ඉදිරිපත් කරන බොහෝ අදහස් වටහා ගැනීමට අපහසු නොවේ. නමුත් ගැමි භාෂා ලක්ෂණ මතුවීම කෙරෙහි එකී තත්සම ප්‍රයෝගවලය වඩා හෙළ වදන් භාවිතය හේතු වී ඇත.

**උපමා, රූපක භාවිතය**

සද්ධර්ම රත්නාවලි කතුවරයා භාෂාවේ උපාංගයක් වශයෙන් උපමා දැක්වීමේ දී නිර්මාණශීලී ලක්ෂණ රාශියක් ප්‍රකට කරනු ලබයි. එහිදී කතුවර අදහස් පැහැදිලව හා නිරවුල්ව දැක්වීමටත්, අසන්නාට සිය අත්දැකීම අනුව රසවිඳගැනීමේ රුචිය ඇති කිරීමටත් උපමා භාවිතකර ඇත. උපමා භාවිතයේ දී කතුවරයා විවිධ සමාජ, සංස්කෘතික ලක්ෂණ ආභාසයට ගනී. ඒ අනුව උපමා දැක්වීමේ ක්‍රමවේද කිහිපයක් හඳුනාගැනීමට පිළිවන. ඒ අනුව,

01. ජනවහරට නැඹුරු උපමා භාවිතය

- නියංසමයේ හඬන ආසක් මෙනි,
- සමහර විෂක් බානා කළ දෂ්ට කළ සර්පයා ලවා ම උරවන්නා සේ..
- හුරුතුඩ සීවැල් තැබුවා සේ..
- පැතුව මනා සම්පත් තිබියදී පොල් ගසින් තල් පක් පතන්නා සේ..
- කන්ට එන බල්ලන්ට අසුරු ගසා සාද කරවන්නා සේ..
- 'පයබරවාට පිටිකර බෙහෙත් බඳිනා සේ ම..
- ඇස් සරහන්ට තොල අඳුන් ගානා සේ..
- ආදා යවා වල්පත් ගත්තා සේ.."

02. පාලි මූලාශ්‍රයානුසාරී උපමා භාවිතය

මෙහිදී කථා වස්තුවට අදාළව ධර්ම කරුණු පැහැදිලි කිරීමේදී පාලි ගාථාවක් කතුවරයා භාවිත කරයි. එහි අර්ථය දැක්වීමේ දී ගාථාවෙහි වූ පාලි අර්ථය රැගත් උපමා භාවිත කරයි. නිදසුන් ලෙස,

– "...අකුසල් සිතින් කළ අකුසලය ගැළ යොදාගත් ගොන් ගිය සේ උන්පයට ගැල්සක් ලංවේ ද එමෙන් පහන් සිතින් කළ කුශලයක් තමාගේ ඡායාව තමා හැර නොපවත්නා සේ අනුව පවත්ති..."

03. පරිකල්පනය ආශ්‍රිත උපමා භාවිතය

– බුදුහු උන්වහන්සේගේ සන්තානයෙහි මඩක තිබූ මැණිකක් මෙන් රහත් වන්නට නිසි හේතුවක් දැක..

– තුන්මසක් මංමුළා වූ කෙනෙකුන් සමසක් මංමුළා වූ කෙනෙකුන්ගෙන් මං විචාරන්නා සේ..

– "ගෙට වැඩ පනවන ලද බුදුහස්නෙහි යුගඳුරු මුදුනෙහි වොරජනා ළහිරු මඬලක් මෙන් වැඩ හුන් සේක,.

– භික්ෂු සංඝයා වහන්සේ ද රන් නැවක් මධ්‍ය කොට පිපි වැනී ගිය රත් නෙළුම් වනයක් මෙන් වැඩ හුන් සේක,.

මීට අමතරව සද්ධර්ම රත්නාවලි කතුවරයා උපමා පමණක් නොව රූපක ධර්ම සන්නිවේදනයෙහිලා උපයෝගී කොට ගනියි. රූපකයක් යනු සමාන කිරීමේ නිපාත රහිතව සෘජුව ම යමක් සමාන කර දැක්වීමයි. සමාන කිරීමේ නිපාත භාවිතයෙන් තොරව යමක් සමාන කර දැක්වීමෙන් රූපකයක් පහසුවෙන් හඳුනාගත හැකි ය. එබැවින් රූපකයක් යනු සැඟවුණු උපමාවක් ලෙස ද හැඳින්වේ. සද්ධර්ම රත්නාවලිය තුළ ද මෙවැනි රූපක රාශියක් භාවිත කර ඇත.

– ශීල සමාද්ධ්‍යාදී ගුණ රුවන්..
– නුවණ දල...
– අකුසල් සතුරා...
– සද්ධර්ම රත්නාවලී කැටපතින්..
– සර්වඥ රසාඤ්ජනය..
– සර්වඥතා හිරු රැස්..

**චරිත නිරූපණ**

සද්ධර්ම රත්නාවලි කෘතිය මුද්‍රිත පිටු එක්දහස් දෙසිය හතළිස් හයකින් සමන්විත ය. එහි කතාවස්තු තුන්සිය අටකින් සමන්විත වුව ද එය කිසි වටෙකත් දුරවබෝධ වූ නීරස සාහිත්‍යයක් නොවුණි. කතුවරයා හුදෙක් ධර්ම කතාවක් කියවීම වෙනුවට සහෘදයා බොදු බැතියෙන්, ජීවිතය පිළිබඳ උපෙක්ෂාවෙන් හා සාහිත්‍ය රසයෙන් පිනවීම කෙරෙහි පෙළඹවීමක් ඇති කරවන්නේ නිරුත්සාහයෙනි. ඊට සමගාමීව ස්වකීය ජීවිතය දෙස යථාභූත ඥානයෙන් බැලීමට සද්ධර්ම රත්නාවලී කතුවරා විවිධ චරිත නිරූපණ ඔස්සේ කතා වස්තු ඉදිරිපත් කරයි.

සද්ධර්ම රත්නාවලියෙහි දක්වා ඇති චරිත සමාජයේ නිරන්තර මුණගැසෙන මනුෂ්‍ය යථාර්ථයන් දැකිය හැකි චරිත වේ. ඔවුනගේ භාෂා විලාසයන්, ක්‍රියාකාරකම් ග්‍රාහකයාට ආගන්තුක නොවේ. නමුත් කතුවරයා ආගමික චින්තනය අනුව යහපත අයහපත පෙන්වාදීම සඳහා කතා වින්‍යාසයට එම චරිත මනාව ගළපා චරිත නිරූපණය කරයි. එහිදී කවර තරමේ දුබලතා දක්වන චරිත වුව ද ඒ දෙස උපෙක්ෂා සහගතව බලාසිටිමත්, ඉන් ජීවිතාවබෝධය ලැබීමට සලස්වයි.

චරිත නිරූපණයේ දී විවිධ සමාජ මට්ටම් හා විවිධ වයස් මට්ටම් නියෝජනය කරන පිරිස් තෝරාගෙන ඇත. භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිව්වණක් පිරිස ඇතුළු විවිධ සමාජ මට්ටම් නියෝජනය කරන චරිත අයත් කතා පුවත් දක්වා ඇත. කතා වස්තු සඳහා තේමා නම් කර ඇත්තේ ප්‍රධාන චරිතයට හෝ සිදුවීමට අදාළව ය. නිදසුන් ලෙස චූල්ලතිස්ස තෙරුන්ගේ වත, කාලි යකින්නගේ කතාව, සමන්දේවී වත, විශාඛා වත, ජීවකයන් පැන විචාළ වත, ධම්මදින්නා වහන්දෑගේ වත, සුමන සාමණේර වත ආදී වශයෙන් දැක්වීමට පිළිවන. පුද්ගල චරිතයට අදාළ නාම රූපයට පසුව 'වත, වස්තුව, කථාව' ලෙස තේමාව ඉදිරිපත් කර ඇත.

සද්ධර්ම රත්නාවලියේ සමස්ත කතා වස්තු තුන්සිය අටෙන් කතා පුවත් පහක් සත්ත්ව චරිත ඇසුරින් ඉදිරිපත් කරයි. තවත් කතාවස්තු අටක් සමාජ සංසිද්ධීන් ඇසුරින් දක්වයි. අමතරව සියලු කතාවස්තු සමාජයේ විවිධ චරිත නියෝජනය කරමින් ඉදිරිපත් කර ඇත.

සියුම් ලෙස පිරික්සා බැලීමේ දී, පාලි බසින් ලියැවී ඇති ධම්මපදට්ඨකතාව දඹදිව සමාජය ඇසුරින් බොහෝ චරිත නිරූපනය කළේ ය. නමුත්, සද්ධර්ම රත්නාවලිය සඳහා මූලාශ්‍ර ලෙස භාවිත කෙරුණු පාලි ධම්මපදට්ඨ කතාවයි.නමුත් ධම්මපදට්ඨ කතාවට පරිබාහිරව දේශීයත්වයට ගැළපෙන ලෙස සකස් කළ චරිත කතා දකගත හැකි ය.

උදාහරණ ලෙස,

- පෙහෙර දුවණියන්ගේ වත
- එක්තරා උපාසක කෙනෙකුගේ වත
- ගෙරි මරකන එකෙකුගේ පුතෙකුගේ වස්තුව
- බිලී වැද්දකුගේ වස්තුව

දක්විය හැකි ය.

**අවස්ථා නිරූපණය**

කථා වින්‍යාසය ඉදිරිපත්කිරීමේ දී වැදගත්වන සාධකයක් නම් අවස්ථා නිරූපණය යි. චරිත නිරූපණයේ දී මෙන් ම අවස්ථා නිරූපණය ද කතාවේ රසභාව අවදිකිරීම විෂයෙහි බලපාන්නකි. එසේම චරිතයක අධ්‍යාත්මික හා භාවමය ලක්‍ෂණ චරිත නිරූපණයෙන් දක්වීමේ දී, එකී චරිතය මතු කෙරෙන අවස්ථාව වැදගත් වේ. අවස්ථා නිරූපණය මඟින් එකී චරිතය ඉදිරිපත් කිරීමේ මූලික අවශ්‍යතාව ඉටු කරයි. සද්ධර්ම රත්නාවලියෙහි හේතුඵල සම්බන්ධතාවයට අනුව ඉදිරිපත් කරන කථා වින්‍යාසය තුළ අවස්ථා නිරූපණ දකගත හැකි ය.

සද්ධර්ම රත්නාවලි කතුවර ධර්මසේන හිමියන් ද සමාජයේ පොදු ජනතාව මුහුණදෙන විවිධ සමාජමය සංසිද්ධි තුළ විවිධ අවස්ථාවන්ට අනුව චරිත ක්‍රියාත්මක වන ආකාරය අවස්ථා නිරූපණය මඟින් ඉදිරිපත් කරයි. එහිදී අවස්ථාව වඩාත් සජීවී ලෙස ග්‍රාහයාට ඉදිරිපත් කිරීම සඳහා

- සංවාදාශීලි භාෂාව

- පරිසරය අදාළ කරගත් භාෂා භාවිත කරයි. එකී ස්වරූප දෙකම නාට්‍යමය, ප්‍රථම පුරුෂ හා උත්තම පුරුෂ දෘෂ්ටිකෝණයෙන් ඉදිරිපත් කරයි.

**සංවාදශීලි භාෂා භාවිත කිරීම.**

මෙහිදී කතුවරයා සංවාදාත්මකව භාෂාව භාවිත කරයි.ඒ ඔස්සේ නාට්‍යමය ස්වරූපයෙන් අවස්ථා නිරූපණය කළ අවස්ථාවක් පහත පරිදි පෙන්වා දිය හැකි ය. එහි කතාන්තදර භාෂා ශෛලියක් ද දකගත හැකිය.

**නිදසුන් 01 - කුණ්ඩලකේශී කථාවස්තුව**

(මුසුප්පුව වැදහොත් නියාව මෑණියෝ දක)

මෑණියෝ: කුමකට ද?

දුවණියඃ මරන්ට ගෙනයන තැනැත්තවුන් දක උන් කෙරෙහි ඇලුම් නියාවත්, උන් ලදොත් මුත් නොලදොත් ජීවත්වීම නියම නැත.

මෑණියෝ: පුතණ්ඩ, එසේ සිතන්නේ ඇයි ද? මුඹ වර්ධනව සිටියවුන් හෙයින්ගෙය තබා හිඳුමෝ ද? ජාති ආදීන් සරි සමාන තැනකට පාවාදිය හැක්ක.

දුවණියඃ අපට අනික් කවුරුනුත් නොකමැත්තෝ ය. මුත් නොලදොත් මියමි.

සිටුපියාණන්: තෙලෙ හැරගෙන තුලූ නො මරා අපට එවනු මැනවි.

''සිටු දුවණියෝ එවක් පටන් ඔහු සිත් ගන්ට සවිබරණ ලා සැරහී තුමූ ම ඕ මට බත් මාළු පිසති. කවති. පොවති. ඉස සෝධවති. නාවති. සොරාණෝ ද කීප දවසෙකින් කළ උපකාරත් නොසලකා 'මෑ මරාපියා මැගේ ආභරණ හැර ගෙක රා බී ඇවිදිනවුන්ට විකොට පියා අභිප්‍රාය දෙයක් හැරගෙන කා පියන්නේ කවර දවසෙක දෝ හෝ යි සිතී ය. සිතා ලා එක් උපදෙසක් සලකා ලා බත් නොකා හැඳට නැඟීලා වැද හොත්තේ ය. සිටුදුවණියෝ ගොසින්,,,''

(දෙදෙනා අතර සංවාදය කතුවරයා ඉදිරිපත් කර ඇත්තේ මෙසේ ය.)

සිටුදුවණියඃ ලෙඩක් නියා ද?

සොරාඃ නැත.

සිටුදුවණියඃ අපගේ දෙමව්පියන්ගෙන් මුසුප්පුවක් ඇති නියා ද?

සොරාඃ එයිත් නැත.

සිටුදුවණියඃ එසේ කළ මුසුප්පු හැයි ද?

සොරාඃ එදවස් මරන්ට ගෙන යන ගමනේ සොරුන් හෙළන ගල දෙවියන්ට යාදිනියක් කොට දිවි ලදිමි. දිවි තබා උන්ගේ ම ආනුභාවයෙන් මාගෙන් කිසි වියදමක් නැතිව තොපත් ලදිමි. උන්ට පිදේණියක් දෙන්ට නැති හෙයින් මුසුප්පුයෙමි.

සිටුදුවණියඃ එව්තරක් වී නම් මුසුප්පු වන්ට නොකැමැත්තේ ය. පිදේණිය පුදමි. වුවමනා කිම් ද?

සොරාඃ ලද පස්මල් හා සමඟ පැන් නුමුසු කිරිබත් වුව මැනැවැ.

සිටුදුවණියඃ යහපත.

(මුළුල්ල සපයාලා)

එන්න යම්හ.

සොරාඃ එසේ වී නම් මැහැඟි පිළිත් ඇඳගෙන මාහැඟි ආභරණත් ලා ගෙන කෙළගෙන සීගෙන යන ගමන හෙයින් තොපගේ නෑයනුත් රඳවාලා යම් හ.

**පරිසරය දායක කරගත් භාෂාව**

වැවයි, දාගැබයි -ගමයි, පන්සලයි වැනි බොඳු ජන සංස්කෘතික සංකල්ප මෙරට ජන සමාජයේ මුල් බැස ගැනීමෙහි ලා බෞද්ධ දාර්ශනික ඉගැනීවීම් මහෝපකාරී විය. මෙමගින් මනා සංස්කෘතික සම්බන්ධතා පිළිබඳ ජනතාව දැනුවත් විණි.

''..අපගේ සදහම් නැමැති අමා ගඟ තමාගේ කන් නැමැති පීලි තබාගෙන සදහම් නැමැති දිය ගෙන ගොසින් සිත් නැමැති කුඹුරු තෙමා ගෙන සැදැහැ නැමැති බිජුවට වපුටගෙන ලොවී ලොව්තුරු සැපත් නැමැති වී මිරිකා ගන්ට අවසරත් පාම් හ,.''

ඉහත නිදසුනවක්ඛුපාල තෙරුන්ගේ වස්තුවෙහි ගොවිතැන පිළිබඳ කෙරෙන සඳහනකි.ඩඑහිදී සද්ධර්ම රත්නාවලි කතුවරයා බුදුසසුන ගොවිතැනට සම කර දක්වයි.ඩිමෙවැනි නිර්මාණශීලි විවරණයන් මගින් කතුවරයා බුද්ධ කාලීන සමාජයේ තතු තත්කාලීන සමාජයට අනුරූප වශයෙන් ආදේශ කර ගනී.

මීට අමතරව පරිසරය ආශ්‍රිත වෙනත් ස්වභාවික සංසිද්ධීන් මානව චරිත ලක්‍ෂණ වලට ගළපමින් කතුවරයා සිය කතාවස්තු නිර්මාණය කර තිබීම දකගත හැකිය.නිදසුනක් වශයෙන් සද්ධර්ම රතන්නාවලියේ පූර්විකාවේ අනේපිඩු සිටාණන්ගේ චරිතය පිළිබඳ කතුවරයා දක්වන විග්‍රහ මෙසේ දැක්විය හැකි ය. එහිදී අනේපිඩු සිටාණන් ධනය හා ශ්‍රද්ධාව සහිතව බුදුරජාණන් වහන්සේට උපස්ථාන කළද උන්වහන්සේ වෙහෙසෙතැයි සිතූ සිටාණන් ප්‍රශ්න ඇසිමෙන් වැළකී සිටිමේ ස්වයං වාරණ පනවා ගැනීම දක්වන්නේ මෙසේ ය.

''.....පොළොව පස් බොහෝ කොට බඩපුරා කෑව හොත් පසුව සැඟ වී වැදහෝනා තැනුත් නැතැ යි යන විරුද්ධ කල්පනාවෙන් ගැඩපුලුන් පස් සුඟකොට කන්නා සේ, නැවත අහස වැටී ගියත් එව්තරක රඳුන මැනව යි යන විරුද්ධ කල්පනාවෙන් කිරුළුන් පා උඩුකුරු කොට වැදහෝනා සේ, නැවත කොස්වා ලිහිණියන් නොසැලී සිටිනා කලට පොළොව ධරා ලිය නොහෙති යි යන විරුද්ධ කල්පනාවෙන් පෙද සලන්නාසේ, මුගේ විරුද්ධ කල්පනාව බලවත් නියායයි ගිය විටකම උන් නොකීවත් බණ කතාවක් වදාරන සේක,,,''

මෙහිදී විවිධ චරිත, අවස්ථා පිළිබඳ ග්‍රාහකයාට මනා අවබෝධයක් ඇති කරවීමට කතුවරයා විසින් සුලබව පරිසර සාධක භාවිත කරනු ලබයි. එමගින් ධර්ම කරුණු අර්ථවත්ව ග්‍රහණය කරගැනීම පහසු මගක් ඔස්සේ ග්‍රාහකයා ආර්ය මාර්ගයට යොමු කිරීමට ධර්මසේන හිමියන් උත්සහ කර ඇත.මේ අයුරින් නුවණ මැඩුවත්, කුසලයෙහි නිරත වීමට කැමැති ජනතාව වෙත, ධර්ම

සන්නිවේදනය සිදුකිරීමේදී ඔවුන් දන්නා දෙයින් නොදන්නා කරුණු අවබෝධ කරවීමේ සන්නිවේදන කාර්ය උදෙසා සද්ධර්ම රත්නාවලි කතුවරයා පරිසර සාධක මනාව උපයුක්ත කරගත් බව පෙන්වාදිය හැකි ය.

**නිගමන**

විවිධ අරමුණුවල ගැලී සිටින, බහුවිධ සමාජය එකම අරමුණකට යොමුකිරීමේ ක්‍රම විද්‍යාව මත සද්ධර්ම රත්නාවලිය වැනි සාහිත්‍ය කෘති රචනා වී ඇත. කතුවරයා බුද්ධ භාෂිතය සමකාලීන ජනයාට ගෝචර වන අයුරින් ඉදිරිපත් කිරීමට උත්සාහ දරා ඇත්තේ සන්නිවේදන ශක්‍යතා සිය ග්‍රන්ථ තුළ නිර්මාණශීලීව භාවිත කරමිනි.

මේ අනුව භාෂාත්මක සන්නිවේදන ශක්‍යතාව සුවිශේෂී වන බව දක්විය හැකි ය. කතා ආකෘති තුළ වූ සැලසුම් සහගත භාවය, භාෂාවේ නිර්මාණශීලීත්වය, භාෂා භාවිතයේදී සංස්කෘතික සබඳතා ගොඩනැංවීම, නව චින්තන ධාරාවන් ඉදිරිපත් කිරීම සාහිත්‍ය සන්නිවේදනයෙහි නිර්මාණශීලී ලක්ෂණයන්ය. බුද්ධ කාලීන සමාජයෙහි පැවති සමාජ, සංස්කෘතික ලක්ෂණ ලාංකේය සමාජ පරිසරයට අනුරූපව දක්වීම ඔස්සේ සද්ධර්ම රත්නාවලිය අන්තර් සංස්කෘතික අධ්‍යයනයකට මග පාදයි. මෙය සද්ධර්ම රත්නාවලිය වෙතින් පිළිබිඹු වන සන්නිවේදන ශක්‍යතාවකි.

ඒ අනුව අකාලික වූ බුදුදහමේ ගැඹුරු දහම් කරුණු අවබෝධය උදෙසා ගද්‍ය සාහිත්‍ය සන්නිවේදන ක්‍රමවේද භාවිතකර ඇත. එබැවින් ධර්ම කරුණු ඉදිරිපත් කිරීමට මෙන් ම අවබෝධ කරගැනීමට භාවිත ධර්ම ව්‍යාප්තියක් ලෙස සද්ධර්ම රත්නාවලිය හැඳින්විය හැකි ය. එකී ධර්මය ව්‍යාප්තිය, ලෞකික අභිවෘද්ධිය සමඟ සබැඳුණු ලෝකෝත්තර සුවය සැලසීම සඳහා අවබෝධය පුළුල් කිරීම නැමැති ධර්ම සන්නිවේදනය කාර්ය මත පදනම් වී තිබේ. ඒ සඳහා ගද්‍ය සාහිත්‍ය නිර්මාණ තුළ භාවිත සන්නිවේදන ක්‍රම විද්‍යාවන් මෙහි අන්තර්ගත වන බව නිගමනය කළ හැකි ය.

**පාදක සටහන්**


01. ඤාණවිමල ස්වාමිපාදයන් වහන්සේ, කිරිඇල්ලේ. (2010). සද්ධර්ම රත්නාවලිය.කොළඹ, ඇම්. ඩී. ගුණසේන සමාගම. 1246 පිටුව.

02. එම. 2 පිටුව.

03. එම.

04. එම.

05. වික්‍රමසිංහ, මාර්ටින්. (1945). සිංහල සාහිත්‍යයේ නැඟීම. රාජගිරිය, සරස ප්‍රකාශකයෝ. 125,126 පිටු.

06. ඤාණවිමල ස්වාමිපාදයන් වහන්සේ, කිරිඇල්ලේ.(2010). සද්ධර්ම රත්නාවලිය. කොළඹ, ඇම්. ඩී. ගුණසේන සමාගම. 2 පිටුව.

07. වික්‍රමසිංහ, මාර්ටින්. (1945). සිංහල සාහිත්‍යයේ නැඟීම. රාජගිරිය, සරස ප්‍රකාශකයෝ. 126 පිටුව.